**AIA Insurance Lanka PLC** (Co. No. PQ 18)
Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com
AIALIFE.COM.LK

# Media Release

## ශ්‍රී ලාංකික වෙල්ත්ප්ලෑනර්වරයකු AIA Top life Saver සම්මානයෙන් පිදුම් ලබයි

කෑගල්ල ප්‍රධාන ශාඛා කාර්යාලයට අනුයුක්ත රඹුක්කන ප්‍රදේශයේ වෙල්ත්ප්ලෑනර්වරයකු වන නිලන්ත සේනාරත්න බණ්ඩාර AIA සමූහය මගින් ආසියා ශාන්තිකර කළාපයෙහි වෙළඳපළ 17ක් ආවරණය කරමින් පවත්වන ලද "Save a Life" තරඟාවලියේ AIA ලෝක ශූරතාවය දිනා ගත්තේය.

''ශ්‍රී ලංකාව සෙසු රටවල් අතරින් කැපී පෙනෙන තත්ත්වයකට පත් කරමින් පිරිනමන ලද මෙම අග්‍රගණ්‍ය සම්මානය මගින් නිලන්ත වෙත පමණක් නොව අපගේ අලෙවි කණ්ඩායම ඇතුළු සමස්ත සමාගම වෙතම ඉමහත් අභිමානයක් හිමි වෙනවා. ඔහුගේ වෘත්තීයමයභාවය වෙනුවෙන් ඔහු වෙත මාගේ සුභාශිංෂණ පිරිනමන අතර මෙම ජයග්‍රහණය සඳහා ඉවහල් වූයේ ඔහුගේ මහත් කැපවීම බවත් සඳහන් කළ යුතුයි.'' යනුවෙන් නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී උපුල් විජේසිංහ පැවසීය.

43 හැවිරිදි තිදරු පියකු වන නිලන්ත "Save a Life" ව්‍යාපෘතියෙහි දියමන්ති පදක්කම දිනාගත් අතර ඒ සඳහා ඔහු සුදුසුකම් ලබා ගත්තේ AIA හි "Make a Difference – Save a life." යන තේමාවෙන් යුත් ව්‍යාපෘතියෙහි කොටසක් වශයෙන් ජීවිත දහසකට අධික සංඛ්‍යාවක සුරක්ෂිතතාව තහවුරු කරමිනි. ඔහු විසින් වසරක කාලයක් තුළ රක්ෂණවර හිමියන් 1096 දෙනෙකු වෙත රක්‍ෂණාවරණය සහ සිතේ සැනසුම උරුම කරදීමට සමත්වූයේ ප්‍රදේශයෙහි එක් වෙල්ත්ප්ලෑනර්වරයකු විසින් සිදුකරන ලද ඉහළම සේවා සැපයුම් සංඛ්‍යාව වාර්තා කරමිනි.

සිය කළාපය තුළ වෙල්ත්ප්ලෑනර් කළමනාකරුවකු වශයෙන් නිලන්ත ලද ජයග්‍රහන අතර AIA ශ්‍රී ලංකාහි දශකයකට අධික සේවා කාලය තුළ 2011 දී MDRT ඇගයුම අත්පත් කරගැනීම සහ  අලෙවිය උදෙසා රජත සහ ස්වර්ණ සම්මානයන් දිනාගැනීම දැක්විය හැක.

''වෙල්ත්ප්ලෑනර් කළමනාකරුවකු වශයෙන් මට බොහොමයක් ප්‍රතිලාභ අත් වුනා. ජීවිතයේ කුමක් සිදුවුවත් මා විසින් සේවා සපයනු ලබන පවුල් වෙත රක්‍ෂණාවරණය සැලසීමට දායක වීමට හැකි වීම පිළිබඳව මා අතිශය තෘප්තිමත් වෙනවා. මා විසින් සිදුකරනුයේ උදේ 9 සිට සවස 5 දක්වා වන සාමාන්‍ය රැකියාවකින් ඔබ්බට ගිය සමාජ මෙහෙවරක් බව මාගේ

හැඟීමයි. මේ අයුරින් ජීවිත සුරක්ෂිතතාව තහවුරු කිරීමට හැකි වීම පිළිබඳව මා සැබැවින්ම සතුටට පත් වෙනවා.'' යනුවෙන් නිලන්ත බණ්ඩාර පැවසීය.

පසුගියදා හොං කොං හි පැවති "AIA **Top** life Savers" සම්මාන උළෙල සහ රාත්‍රී භෝජන සංග්‍රහයට සහභාගී වීම සඳහා නිලන්ත සමග දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සංවර්ධන කාර්යාලයේ දේවිකා අරුණ කුමාරි සහ අශෝකා වයලට් යන මහත්මීන්ද එක් වූහ.

**ඡායාරූප ඃ**

1 හොං කොං හිදී සිය සම්මානය ලබාගැනීමෙන් අනතුරුව නිලන්ත බණ්ඩාර (වමේ සිට සිව් වැන්නා), AIA සමූහ ප්‍රධාන විධායක නිලධාරී සහ සභාපති මාර්ක් ටකර්, AIA ශ්‍රී ලංකාහි ප්‍රධාන විධායක නිලධාරී ෂා රූෆ් සහ දේවිකා අරුණ කුමාරි, AIA හි ජ්‍යෙෂ්ට කළමනාකරුවන් සමග ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

2 අශෝකා වයලට් AIA සමූහ ප්‍රධාන විධායක නිලධාරී සහ සභාපති මාර්ක් ටකර් සමග ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

සමාප්තයි.

**Media Enquiries: Suren Perera, Head of Marketing & Company Spokesman Office 2310028, Mobile – 0773 457 959**